# මුල් බුදුසමය සහ නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය

ලෝක සත්ත්වයා සසර කතරෙන් මිදීමට අනුගමනය කළ යුතු මග බුදුරජාණන්වහන්සේ අනුදැන වදාළ හ. එම මගට පිවිසීමට බාධා කරන විවිධ දෘෂ්ටි හැට දෙකක් හඳුනාගත් උන්වහන්සේ ඒවා මිථ්‍යාදෘෂ්ටි ලෙස නම් කර ප්‍රතික්ෂේප කළ සේක. දීඝ නිකාය-බ්‍රහ්මජාල සූත්‍රයේ මේ පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා වේ. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑමෙන් වසර දෙ දහසකට පමණ පසු, ලෝකයේ චින්තන ආධිපත්‍යය ලබාගත් බටහිර චින්තනය තුළ ද බිහි වූ සියලු ම මතවාද බ්‍රහ්මජාල සූත්‍රයේ දී උන්වහන්සේ ප්‍රතික්ෂේප කළ මිථ්‍යාදෘෂ්ටි ගණයට වැටෙන බව වැඩි අපහසුවකින් තොරව පෙන්වා දිය හැකි ය. විඥානවාදී සහ භෞතිකවාදී ලෙස ගැනෙන විවිධ මතවාද ඒ අතර වේ. කෙසේ වෙතත් වත්මන් ලෝක සන්දර්භය තුළ බටහිර දැනුමට ඇති ආධිපත්‍යය හේතුවෙන් බොහෝ දෙනකුට කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් හෝ එම මතවාද හැදෑරීමටත් ඒ අනුව කටයුතු කිරීමටත් සිදු ව ඇත. අද වන විට බටහිර දැනුම ලෝකයේ ඇති එක ම දැනුම බව ඒත්තු ගන්වා ඇති අතර ඒ ගැන ප්‍රශ්න කිරීම පවා විවිධ අයුරින් වළක්වා ඇත. මේ හමුවේ මුල් බුදු සමයේ අදහස් දාර්ශනික පසුබිම් ඔස්සේ බටහිරින් එන විවිධ මතවාදවලට මුහුණ දීමට හැකි ආකාරයේ අදට ගැලපෙන දැනුමක් නිර්මාණය කරගැනීමේ ජාතික අවශ්‍යතාවක් මතු විය. විජාතික මතවාදීය ආක්‍රමණයෙන් සිංහල ථෙරවාදය බුදු සමය රැක ගැනීම ද අරමුණු කර නිර්මාණය වූ එම දැනුමේ වැදගත් ම කොටසක් නම් නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයයි. පරමාර්ථ ලෙස පවතින කවර හෝ යමක් මුල් බුදු සමයෙන් ප්‍රතික්ෂේප වේ. "සබ්බේ ධම්මා අනත්තානී" ලෙස ධම්මපදයේ පැවසෙන පරිදි පරමාර්ථ ලෙස පවතින සත්ත්වයකු, ආත්මයක් පමණක් නො ව කිසිදු ධර්මතාවක් හෝ නොමැත. එනම් වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම බුදු දහම අනාත්මවාදී දහමකි. මුල් බුදු සමයේ දැක්වෙන, පැවසෙන මේ අනාත්මවාදී ගුණය නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයේ තවදුරටත් ඔපමට්ටම් වී ඇත. එය අදට සරිලන දැනුමක් ලෙස නිර්මාණශීලීව ඉදිරිපත් වී ඇත. දැනුම (ලෝකය) මනසට ඉන්ද්‍රිය පද්ධතියට සහ සංස්කෘතියට සාපේක්ෂව, අනිත්‍ය දුක්ඛ අනාත්ම පිළිබඳව ඇති අනවබෝධය (අවිද්‍යාව) නිසා නිර්මාණය කෙරෙන බව නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයේ දී පැවසේ. "මනෝ පුබ්බංගමා ධම්මා" ලෙස පැවෙසෙන මනසෙහි ප්‍රධානත්වය එහි දී ද පිළිගැනෙන අතර මනස ද මනසේ ම නිර්මාණයක් ලෙස ඉදිරිපත් කිරීමෙන් අනාත්මවාදී බව නිසැක ලෙස ම තහවුරු කෙරී ඇත. එනම් නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය මුල් බුදු සමය ඇසුරු කරගත් ඊට පටහැනි නෙ වන ඒ හා සංගත වන දාර්ශනික පද්ධතියකි. සම්‍යග්දෘෂ්ටියකි.